Consulate General of the Democratic
Socialist Republic of Sri Lanka

القنصلية العامة لجمهورية
سري لانكا الديمقراطية الاشتراكية

# දැන්වීමයි

කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ ඩුබායි හා උතුරු එමීරයන්හි වෙසෙන ශ්‍රී ලාංකියන් හට උපකාර කිරීම කොන්සල් ජනරාල් කාර්යාලය විසින් අඛණ්ඩව සහ කැපවීමෙන් යුතුව සිදුකරනු ලැබේ.

මේ වනතෙක් කොන්සල් ජනරාල් කාර්යාලය විසින් 1750 ක පමණ වියළි ආහාර ප්‍රමාණයක් ඩුබායි සහ උතුරු එමීරයන්හි බෙදාහැර ඇති අතර, එමගින් ආපදාවලට ලක්වූ පුද්ගලයින් 5000 කට අධික සංඛ්‍යාවකට සහන සැලසී ඇත. මෙම වියළි ආහාර බෙදා හැරීමේ ක්‍රියාවලිය දිගින් දිගටම සිදුකරමින් පවතින අතර ඒවා බෙදා හරිනු ලබනුයේ විදේශ සබඳතා අමාත්‍යාංශය, විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ මෙරට සමාජසේවා සංවිධානවල සහ පරිත්‍යාගශීලී පුද්ගලයින්ගේ ආධාර සහ උපකාරයන් තුළිනි.

කොවිඩ් 19 ආසාදිත ශ්‍රී ලාංකික පුද්ගලයින්ට අවශ්‍ය කඩිනම් වෛද්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා නිරන්තර සොයා බැලීම් මෙම කාර්යාලය විසින් සිදුකරන අතර ගිලන්රථ සේවා සහ රෝහල් පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණයද සිදුකරන ලදී. අවශ්‍ය සෑම අවස්ථාවකදීම ඩුබායි සිටින ශ්‍රී ලාංකික වෛද්‍යවරුන් සම්බන්ධ කරගනිමින් රෝගීන්ට අවශ්‍ය වෛද්‍ය උපදෙස් සහ ඔවුන්ගේ මානසික තත්වය නගා සිටුවීමට අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබාදීම නිරන්තරයෙන් සිදුකරනු ලැබේ. මීට අමතරව අප නිරන්තරයෙන් මෙම රෝගීස් සමග සම්බන්ධවී ඔවුන්ගේ සෞඛ්‍ය තත්වය සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු කරන අතර ඔවුනට අවශ්‍ය කරන සහාය ලබාදීමටද නිරන්තරව කටයුතු කරනු ලබයි.

අප ප්‍රමුඛත්වයන් ලබාදී ඇත්තේ මෙම වසංගත තත්ව හමුවේ අහිතකර පීඩාවන්ට පාත්‍රවූ ශ්‍රී ලාංකිකයින්ව කඩිනමින් මව්රට කරා යෑමට අවශ්‍ය කරන්නාවූ නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ ගුවන්යානා පහසුකම් සැපයීම සම්බන්ධවය. කෙසේ වෙතත් නැවත ශ්‍රී ලංකාවට ශ්‍රී ලාංකිකයින් පිටත් කර යැවීමේ කාර්යයේ තිබෙන්නාවූ ප්‍රමාදයන් නිසා අවලංගුවූ සහ කල් ඉකුත්වූ වීසා සහිතව එක්සත් ආරාබි එමීර් රාජ්‍යයේ රැඳී සිටින ශ්‍රී ලාංකිකයින්ට සහන ලබා ගැනීමේ අරමුණින් අබුඩාබි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ මෙම කොන්සල් ජනරාල් කාර්යාලය මගින් එක්සත් ආරාබි එමීර් රාජ්‍ය පාර්ශවයින්ගෙන්, දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති සහන කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලීම් කර ඇත. එයට අදාලව, 2020.07.28 වන දින ගරු කොන්සල් ජනරාල්තුමා ඩුබායිහි විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධානී ශේක් මක්තුම් බින් බූටි අල් මක්තුම් උතුමාණන් (Sheikh Maktoum bin Butti Al Maktoum) මුණ ගැසී එක්සත් ආරාබි එමීර් රාජ්‍යයේ වාසය කරන ශ්‍රී ලාංකිකයින් මුහුණ පා සිටින අර්බුදකාරී තත්වයන් සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇත. ශ්‍රී ලාංකිකයින් නැවත ලංකාවට ගෙන්වා ගැනීමේ කාර්යය ලංකාවේ රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය කිරීමේ කටයුතු සිදුකරන අතර, කොපමණ ශ්‍රී ලංකිකයන් ප්‍රමාණයක් නැවත ගෙන්වා ගන්නේද යන්න ශ්‍රී ලංකාවේ නිරෝධායන මධ්‍යස්ථානවල පවතින ඉඩපහසුකම් අනුව තීරණය වනු ඇත.

ශ්‍රී ලාංකිකයින් නැවත ශ්‍රී ලංකාවට පිටත් කර යැවීමේ කාර්යයේදී ප්‍රමුඛස්ථානය ලබාදීම සඳහා සලකා බලන නිර්ණායකයින් වන්නේ අවලංගුවූ / කල් ඉකුත්වූ වීසා, ගර්භනී මාතාවන්, ජ්‍යේෂ්ඨ පුරවැසියන්, ඉතා බරපතළ සෞඛ්‍ය තත්වයන් යටතේ වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය පුද්ගලයින් (වෛද්‍ය වාර්තා අවශ්‍යවේ) සහ අනෙක් විවිධ රැකියා කාණ්ඩඃ එනම් සේවය අවසන්කළ/ සේවයෙන් ඉවත්වූ සහ පඩි රහිත නිවාඩු යනාදිය සලකා බලනු ලබයි.

ශ්‍රී ලංකාවට යාමට අපේක්ෂාවෙන් අපගේ වෙබ් අඩවියෙහි දැනටමත් ලියාපදිංචිවී ඇති හා ඔබගේ ඉල්ලීම් අප වෙත ඉදිරිපත් කර ඇති සියලූ දෙනා නැවත නැවතත් මෙම කොන්සල් ජනරාල් පරිශ්‍රයට පැමිණමට අවශ්‍ය

P.O.Box: 51528, Dubai, U.A.E.
Tel: +971 4 3986535 Fax: +971 4 3984687
E-mail: condubai@slcgdxb.ae

ص.ب: ، دبـي - الامارات العربية المتحدة
تليفون: ٣٩٨٦٥٣٥ ٤ ٩٧١+ ، فاكس : ٣٩٨٤٦٨٧ ٤ ٩٧١+
البريد الإلكتروني : condubai@slcgdxb.ae

නොවන බව කාරුණිකව දන්වා සිටිමු. කිසිවිටකත් අප කාර්යාලටය පැමිණ ලියාපදිංචි නොවු හෝ ඉල්ලීම් අපවෙත ඉදිරිපත් කර නොමැති සියළුදෙනා හට අප කාර්යාලට පැමිණ ඉල්ලීම් ලබා දීමට අවස්ථාව ලබා දිය යුතුය.

තවදුරටත් අප ඔබ වෙත දන්වා සිටින්නේ කොවිඩ් 19 වසංගත තත්වයන් සම්බන්ධයෙන් එක්සත් ආරාබි එමීර් රාජ්‍යයේ බලධාරින් විසින් ලබාදී ඇති උපමාන අනුව මෙම වසංගතය වැළැක්වීමේ ක්‍රමයක් වශයෙන් සමාජ දුරස්ථභාවය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් උපදෙස් පිළිපැදීමට අප බැඳී සිටින බවයි.

නැවත වරක් අප ඔබට සහතික වනුයේ මෙම දුෂ්කර අවස්ථාවේ ඔබට අවශ්‍ය වන්නාවු සියලු සහයන් ලබා දීමට අප කැපවී කටයුතු කරන බවය. අප බලාපොරොත්තු වනුයේ නැවත මගී ගුවන් යානා ගමන්වාර ආරම්භ කිරීම සඳහා සුදුසු වාතාවරණයක් ඉතා ඉක්මනින් නිර්මාණය වනු ඇති බවය. අප සැවොම එක්ව මෙම වසංගත තත්වය හමුවේ එකිනෙකා සමග එකමුතුව කටයුතු කරමින් විසඳුම් වෙත ගමන් කිරීම අප සෑමදෙනා හටම වැඩදායක වන බව අප දන්වා සිටිමු.